ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය
தேசிய மொழிக்கல்வி மற்றும் பயிற்சி நிறுவனம்
**National Institute of Language Education and Training**
අධිකරණ හා ජාතික ඒකාබද්ධතා අමාත්‍යාංශය
நீதி மற்றும் தேசிய ஒருமைப்பாடு அமைச்சு
**Ministry of Justice and National Integration**
321/1, හයිලෙවල් පාර, මාකුඹුර, පන්නිපිටිය
321/1, ஹைலெவல் வீதி, மாகும்புர, பன்னிபிட்டிய
321/1, High Level Road, Makumbura, Pannipitiya

---

මගේ අංකය / எனது இல / My No: NILET/ADMIN/2025/04/pro-pho.co-01
ඔබේ අංකය / உமது இல / Your No:
දිනය / திகதி / Date: 2025.09.08

EWIS PERIPHERALS (PVT) LTD.
14
15 SEP 2025
RECEIVED

ඊවිස් පුද්ගලික ආයතනය

අංක 142, යතම් ගොඩනැගිල්ල,

කොළඹ 03

<u>ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් මිලදී ගැනීම</u>

මෙම ආයතනය සඳහා ඡායා පිටපත් යන්ත්‍ර දෙකක් මිලදී ගත යුතුව ඇත. එම මිලදී ගැනීම සම්බන්ධ පිරිවිතර මේ සමඟ අමුණා ඇති අතර, ඔබ ආයතනයෙන් ලබා දිය හැකි ඡායා පිටපත් යන්ත්‍ර මිල ගණන් 2025.09.30 දිනට හෝ ඊට පෙර “ඡායා පිටපත් යන්ත්‍ර මිල ගණන්” ලෙස ලියුම් කවරයේ ඉහල කෙලවරේ සඳහන් කර, අධ්‍යක්ෂ (පාලන), ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනය, මාකුඹුර, පන්නිපිටිය වෙත ලියාපදිංචි තැපෑලෙන් ලැබීමට හෝ ඔබගේ මුද්‍රා තබන ලද මිල ගනන් පාලන අංශයේ තබා ඇති ලංසු පෙට්ටියට බහාලිය යුතුය.

ලංසු කැඳවීම 2025.09.30 දින ප.ව 2.00ට අවසන් කරනු ලබන අතර, එදින ප.ව 2.30ට ලංසු විවෘත කරනු ලැබේ. ලංසු විවෘත කරන අවස්ථාවට ඔබට හෝ ඔබගේ ලිඛිත අවසරය ලත් නියෝජිතයෙකුට පෙනී සිටිය හැක.

ඡායා පිටපත් යන්ත්‍ර මිලදී ගැනීමේ මිල ගණන් 2025.09.30 දින සිට දින 60ක් වලංගු විය යුතු අතර, මිල ගණන් භාර ගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය ජාතික භාෂා අධ්‍යාපන සහ පුහුණු ආයතනයේ ප්‍රසම්පාදන කමිටුව සතුය. මිලදී ගැනීම සඳහා ඔබ තෝරා ගතහොත් ඡායා පිටපත් යන්ත්‍ර දෙක ආයතනය වෙත ලබා දීම සඳහා ගතවන කාලය ඉහත මිල ගණන් සමඟ සඳහන් කරන ලෙස වැඩිදුරටත් දන්වා සිටිමි.

~~ශමින්ද මහලේකම්~~
අධ්‍යක්ෂ ජනරාල්(වැ.බ)

දු.අංකය - 011-2086420
ෆැක්ස් - 011-2086422
ඊ මේල් - nilet.da.100@gamil.com

---